**ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය - 2023**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1930 අංක 10 දරන රබර් පර්යේෂණ ආඥා පනතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පහත සඳහන් නිරීක්ෂණ හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02ට අනුකූල වී නොතිබුණි.** | | |
| (i) | සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජන සඳහා ලැබූ රු.6,421,170ක පොලිය රු.5,320,211ක් ලෙස රු.1,100,959ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කර තිබීම. | 2023 වර්ෂයේ ලැබී තිබූ පොළී ආදායම තුල පෙර වර්ෂයේ ලැබිය යුතු පොළිය හා අඩමාණ ණය සඳහා වෙන් කිරීම් සඳහා අදාල මුදල රු.222,977ක් ගිණුම් ගත වී තිබූ හෙයින් අදාල ශේෂවලින් අඩු කර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පෙන්වීමට කටයුතු කර ඇත. | වර්ෂය තුළ ලද මුළු පොළිය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් කළ යුතුය. |
| (ii) | කාරක ප්‍රාග්ධන ගැලපීමේදී වෙනත් ජංගම වත්කම්හි වෙනස රු.619,963ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් කර තිබීම. | -එම- | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසීමේදී කාරක ප්‍රාග්ධන වෙනස්වීම් නිවැරදිව ගැලපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේදී වාහන 03ක් විකිණීමෙන් ලැබූ රු.3,788,101ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ලැබීම් ලෙසට ගැලපීම් කර නොතිබීම. | ඉදිරියේදී මෙම ගනුදෙනු ගිණුම් ගත කිරීමේදී මුදල් ගලා ඒම හා ගලා යාම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ හෙළිදරව් කිරීමට පියවර ගනු ඇත. | වාහන විකිණීමෙන් ලද මුදල, මුදල් ගලා ඒමක් ලෙසට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ගැළපීම් කළ යුතුය. |
| (iv) | 2023 වර්ෂයේ දී ජංගම නොවන වත්කම් මිලදී ගැනීම සඳහා මණ්ඩලය විසින් ගෙවීම් කර තිබුණු රු.74,307,668ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.95,266,009ක් ලෙස ගැලපීම් කර තිබුණු බැවින් ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් රු.20,958,341කින් අවප්‍රමාණය වී තිබීම. | දේපල පිරියත හා උපකරණ ලේඛනයට අනුව නව වත්කම් වල අගය වර්ෂය තුල අළුතින් එකතු වූ වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇති බැවින් එම අගය මුදල් ප්‍රකාශනයට ගෙන ඇත. | වත්කම් මිලදී ගැනීමට යෙදවූ මුදල් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැළපීම් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09හි 15ඡේදය ප්‍රකාරව සහ මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්ති අනුව අවසන් තොගයේ වටිනාකම පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද එසේ ගණනය කිරීමකින් තොරව විකිණීමට තිබුණු රබර් තොගය රු.10,989,087ක වෙළඳපල වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආයතනයේ රබර් තොගවල නිෂ්පාදනය සඳහා ගිය වියදම වෙනම ගණනය කර නොතිබූ හෙයින් රබර් තොගයේ වටිනාකම වෙළඳපල වටිනාකමට පෙන්වා ඇති අතර එය 2024 වර්ෂයේදී නිවැරදි කොට ඉදිරිපත් කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අවසන් තොගයේ වටිනාකම පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ සේවක පාරිතෝෂික වටිනාකම ගණනය කිරීමේදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 19 ප්‍රකාරව ආයුගණන ක්‍රමය යොදාගෙන නොතිබුණි. | මෙහිදි ආයුගණන ක්රමය යොදා ගැනීමට පිළිගත් ආයුගණකවරයකු තෝරාගත යුතු බැවින් ඒ සඳහා විශාල පිරිවැයක්ද දැරීමට සිදු වේ. එබැවින් මේ පිළිබඳ අධ්‍යානය කර 2024 වර්ෂයේ සිට ප්‍රමිතයට අනුකූලව පාරිතෝෂික වටිනාකම් ගණනය කිරීමට කටයුතු කරනු ඇත. | සේවක පාරිතෝෂික වටිනාකම ගණනය කිරීමේදි ප්‍රමිතිය ප්‍රකාරව ආයුගණන ක්‍රමය යොදාගත යුතුය. |
| (ඈ) | රු.24,985,636ක් වූ ධාරක හා පාරිභෝජ්‍ය ජෛව වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 අනුව මූල්‍ය ප්‍රකාශනවල වෙනම හඳුනා නොගෙන දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් ප්‍රකාශනවල ධාරක හා පාරිභෝජ්ය ජෛව වත්කම් අගය වෙනම පෙන්වීමට 2024 වර්ෂයේ දී පියවර ගනු ඇත. | ප්‍රමිත ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් වෙනම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මණ්ඩලය සතු ඩාර්ටන්ෆීල්ඩ් හා කුරුවිට වතුයායන්හී ආදායමින් රු.11,000,000ක් රබර් පර්යේෂණ ආයතනයේ ආදායම් ලෙස සලකා මණ්ඩලයේ වියදම් සඳහා යොදා ගැනීමට කටයුතුකර තිබුණු බැවින් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම වටිනාකම ආදායම් හා වියදම් ලෙස දෙවරක් ගිණුම් ගතවී තිබුණි. | වතු අංශවලින් උපයා ගන්නා ලද ආදායමින් රු.මිලියන 11ක් රබර් පර්යේෂණ ආයතනයේ ආදායමක් ලෙස ලබා ගැනීම සඳහා 2023 වර්ෂයේ අයවැය මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් නිවැරදිව දැක්විය යුතුය. |
| (ඊ) | පුද්ගලයින් දෙදෙනෙකු විසින් රබර් පර්යේෂණ මණ්ඩලයට අයිති අක්කර පහක ඉඩමට හිමිකම් පෑම සඳහා මණ්ඩලයට එරෙහිව කොළඹ අභියාචනාධිකරණයේ පවරා ඇති නඩුව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | මෙම නඩුව වතු අංශය විසින් පවරා ඇති අතර එහි තොරතුරු පරිපාලන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර නොතිබුණි. ඉදිරියේදී මෙය හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ආයතනය විසින් හා ආයතනයට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ ටයර් මධ්‍යස්ථානයට 2021 වර්ෂයේදී රු.1,020,600කට මිලදී ගෙන තිබුණු "Dumbbell Die උපකරණය" පාරිභෝජන ද්‍රව්‍ය ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගලපා තිබුණු බැවින් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි. | ගබඩාවෙන් GRN නිකුත් කිරීමේදී ගිණුම් සංකේත අංක වැරදි ලෙස සටහන් වීම නිසා ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත වී නැත. එම නිසා නිවැරදි කිරීම් 2024 වර්ෂයේ කටයුතු කරනු ඇත. | මිලදී ගැනීම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේදී රු.2,617,462ක ප්‍රාග්ධන කාර්යයන් 03ක වැඩ නිමකර තිබුණ ද ඒ සඳහා ඉංජිනේරු සහතිකයක් නිකුත් කර නොතිබුණු බැවින් 2023 වර්ෂයේ ද මෙම වැඩිදියුණු කිරීමේ වටිනාකම කෙරීගෙනයන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ දී මෙම කොන්ත්‍රාත් වල වැඩ කොටස් නිම කර ඇති බව නේවාසික ඉංජිනේරු විසින් වාර්තා කර නොතිබුණු බැවින් කෙරීගෙනයන වැඩ ලෙස 2023 වර්ෂයේ මූල්‍ය ප්රකාශනවලින් හෙළිදරව් කර ඇත. | ඉදිකිරීම් කටයුතු නිමකළ වහාම ඉංජිනේරු සහතිකය මත එම වියදම් ප්‍රාග්ධනිත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ලැබීමට පෙර පර්යේෂණ වාර්තා නිකුත් කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.1,017,114ක ණයගැති ශේෂයක් පෙන්නුම් කළ අතර එහි ඇතුළත් වර්ෂ 5ට වැඩි ණය ගැති ශේෂය රු.33,398ක් වූ අතර වර්ෂ 1ත් 2ත් අතර ණය ගැති ශේෂය රු.206,800ක් විය. | වර්ෂ 5 ට වඩා වැඩි ණයගැති ශේෂ වලින් රු.12,822ක් අයකර ගෙන ඇති අතර ඉතිරි රු.20,575කි. එම ශේෂ නිරවුල් කිරීම සඳහා ඉදිරි ආයතන විගණන හා කළමණාකරණ කමිටුවල සාකච්චා කර පියවර ගනු ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව පියවරක් ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | (i) VII පරිච්ඡේදය | පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුරුවල රාජකාරි ඉටු කිරීම සඳහා පත්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 1/9ක විශේෂ දීමනාවක් ගෙවා තිබුණි. | මේ පිළිබඳව නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු වාර්තා කර නිවැරදි කිරීමට පියවර ගනු ඇත. | විධිමත් විධි විධාන ප්‍රකාරව අනුමත දීමනා පමණක් ගෙවීම් කළ යුතුය. |
| | (ii) XII වැනි පරිච්ඡේදය | විශේෂ අවස්ථාවකදී හැර විවේක හා අනියම් නිවාඩුවලට අමතරව අසනීප නිවාඩු ලබා ගැනීමේ හිමිකමක් නොමැති වුවත් රබර් පර්යේෂණ ආයතනයේ සේවකයන් සඳහා විවේක හා අනියම් නිවාඩුවලට අමතරව | ආයතනය සතුව දැනට භාවිතා කරනු ලබන කාර්ය පටිපාටි අත්පොත සඳහා අනුමැතිය ලැබී නොමැති බැවින් මේ පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කොට ඒ අනුව ලබා දෙනු ලබන උපදෙස් වලට අනුකූලව, | ආයතන සංග්‍රහයට අනුකූලව නිවාඩු අනුමත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වෛද්‍ය නිවාඩු හිමිකමක් ද ලබා දී රාජ්‍ය නිලධරයකු සඳහා එක් වර්ෂයකදී හිමි අනියම් නිවාඩු දින 21ක් සහ විවේක නිවාඩු දින 24ක් බැගින් වූ නිවාඩු දින 45ක ප්‍රමාණය වෙනුවට, රබර් පර්යේෂණ ආයතනයේ අනුමත කර නොගන්නා ලද කාර්ය පටිපාටි අත්පොත අනුව එක් වර්ෂයක් සඳහා විධායක ශ්‍රේණිවල නිලධාරීන් සඳහා නිවාඩු දින 58ක් ද අනෙකුත් ශ්‍රේණිවල නිලධාරීන් සඳහා නිවාඩු දින 53ක් ද ලබා දී තිබුණි. | ආයතන සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව නිවාඩු පිළිබඳ කටයුතු කිරිමට ඉදිරියේදි පියවර ගනු ඇත. | |
| | (iii) XV පරිච්ඡේදයේ 4:7 වගන්තිය | අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 05 දෙනෙකුගෙන් වර්ෂ 01 සිට වර්ෂ 33 දක්වා කාලයක් තුළ මණ්ඩලයට අයවිය යුතු එකතුව රු.4,256,552ක් 2024 ජූලි 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි. | කොන්දේසි කඩ කල නිලධාරින්ගෙන් රු.729,047ක මුදල් ප්‍රමාණයක් අය කර ගැනීමට කටයුතු කල අතර දෙදෙනෙකු විසින් ගෙවිය යුතු මුදල් වාරිකව ගෙවීමට කටයුතු කර ඇත. දෙදෙනෙකුගේ ශේෂ පිළිබඳ ගැටළු සහගත තත්වයක් ඇති බැවින් එම කරුණු ආයතනික විගණන කළමණාකරණ කමිටුවට වාර්තා කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවල ට අනුකූලව බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් ගෙන් හෝ ඇපකරුවන් ගෙන් අදාළ මුදල් අයකර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(3) | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කොන්ත්‍රාත්වලින් රඳවා ගන්නා ලද රු.3,086,087ක් සහ නැවත ගෙවීමේ කොන්දේසිය මත | පෙර වර්ෂවලට අදාල නැවත ගෙවිය යුතු තැන්පතු තුල තිබූ නැවත ගෙවිය නොහැකි ලෙස තහවුරු කර ගත් අගයන් ගලපා ඇති අතර ඉතිරි ශේෂයන් තහවුරු කර | මුදල් රෙගුලාසි ප්‍රකාරව රඳවා ගැනීම් හා ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙ |

| | | | | |
|---|---|---|---|---|
| | | ටෙන්ඩර් සඳහා ලබාගත් තැන්පතු රු.1,227,700ක් ආපසු ගෙවීමට හෝ මුදල් රෙගුලාසිය ප්‍රකාරව ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | ගත් පසු අදාල ගැලපීම් සිදු කරනු ඇත. | න් කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ.371(5) | අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යයන් අවසන් කර දින 10ක් ඇතුළත පියවිය යුතු වුවද, මණ්ඩලය විසින් 2023 වර්ෂයේදී ලබා දී තිබුණු එකතුව රු.544,200ක තත්කාර්යය අතුරු අග්‍රිම 39ක් පියවීම සඳහා දින 14ත් දින 68ත් අතර කාලයක් ප්‍රමාද කර තිබුණි. | අත්තිකාරම් බොහොමයක් ප්‍රමාද වී නිරවුල් කිරීම ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | අදාළ මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා ඊට අනුකූලව නිකුත් කළ ආයතනික යහපාලනය පිලිබඳ මාර්ගෝපදේශය | 2023 වර්ෂය සඳහා සකස්කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ආයතනයේ අරමුණු, උපායමාර්ග, ක්‍රියාකාරකම්, මාසික ඉලක්ක හා වගකිව යුතු නිලධාරීන් ඇතුළත් කර නොතිබුණු අතර මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ද සකස් කර නොතිබුණි. | අමාත්‍යාංශය විසින් ලබාදෙන ආකෘතිය පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය සෑම වර්ෂයකම ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලබන අතර එයට අනුකූලව කටයුතු ක්‍රියාත්මක කර ඇත. ඉදිරියේදී විධිමත් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාකිරිමට කටයුතු කරනු ඇත. | අදාල චක්‍රලේඛයේ තොරතුරු ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු අතර මානව සම්පත් සැලැස්මක්ද සකස් කළ යුතුය. |
| (ඉ) | 2023 සැප්තැම්බර් 27 දිනැති අංක පීඊඩී 01/2021(iii) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සියළුම රාජ්‍ය ව්‍යවසායන් එම ආයතනයට සුදුසු පරිදි පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ | ආයතනය සතුව දැනට භාවිතා කරනු ලබන කාර්ය පටිපාටි අත්පොත සඳහා අනුමැතිය ලැබී නොමැති බැවින් මේ පිලිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කොට ඒ අනුව | චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය පටිපාටි අත්පොත සඳහා අනුමැතිය ලබාගත |

| | | | | |
|---|---|---|---|---|
| | | අනුමැතිය ලබාගත යුතු වුවද රබර් පර්යේෂණ මණ්ඩලයේ කාර්යය පටිපාටි අත්පොතට එම අනුමැතිය ලබාගෙන නොතිබුණු නමුත් එම අත්පොත අනුව කටයුතු කර තිබුණි. | ලබා දෙනු ලබන උපදෙස් වලට අනුකූලව, ආයතන සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කිරිමට ඉදිරියේදි පියවර ගනු ඇත. | යුතුය. |
| (ඊ) | 2009 ජුනි 17 දිනැති අංක 09/2009(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආයතන ප්‍රධානීන් ඇතුළුව සියලුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වුවත් රබර් පර්යේෂණ මණ්ඩලයේ නිලධාරීන් 51 දෙනෙකු ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රය මගින් රාජකාරියට පැමිණීම සහ පිටවීම සටහන් කර නොතිබුණි. | ආයතනයේ ඇතැම් නිලධාරින්ගේ ඇඟිලි සටහන්, යන්ත්‍රය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් එම නිලධාරීන් වෙනම ලේඛනයක අත්සන් කිරිමේ ක්‍රමවේදයක් දැනට පවතී. එසේ වුවත් ඇඟිලි සලකුණු සටහන් කිරිමේ යන්ත්‍රය සපයා ඇති ආයතනය සමග සාකච්ඡා කොට මේ පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් සකස් කිරිමට කටයුතු කරනු ඇත. | සියළුම කාර්යමණ්ඩලය පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු සටහන් යන්ත්‍රයේ සටහන් කළ යුතුය. |
| (උ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ | | | |
| | (i) 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, | ආයතනයේ භාවිතා කරන වාහන සම්බන්ධව ඉන්ධන දහනය පිලිබඳ පරික්ෂාවන් එහි සඳහන් උපදෙස් වලට අනුකූලව සිදු කරන ලෙස නේවාසික ඉන්ජිනේරු වෙත උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලයේ වාහන 08ක් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | | |
| (ii) 3.3 ඡේදය | මණ්ඩලයේ ඉන්ධන පරීක්ෂාව සිදු කළ වාහන 39ක් සම්බන්ධයෙන් යථෝක්ත චක්‍රලේඛයේ ආකෘතිය ප්‍රකාරව සටහන් පවත්වා නොතිබීම හේතුවෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකළ දින සිට පාවිච්චි කළ ඉන්ධන ප්‍රමාණය හා පසුගිය මාසයේදී පාවිච්චි වූ ඉන්ධන ප්‍රමාණය වෙනස්වීම් සිදුවී තිබේද යන්න පරීක්ෂා කිරීමට විගණනයේදී නොහැකි විය. | ඉන්ධන පරීක්ෂාව සිදුකළ දින සිට පාවිච්චි කළ ඉන්ධන ප්‍රමාණය හා පසුගිය මාසයේදී පාවිච්චි වූ ඉන්ධන ප්‍රමාණයේ වෙනස්වීම් සිදුවී තිබේද යන්න පරීක්ෂා කිරීමට හැකි පරිදි අදාල තොරතුරු පවත්වාගෙන යන ලෙස නේවාසික ඉංජිනේරු වෙත උපදෙස් ලබා දී ඇත . | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |
| (ඖ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වගන්තිය | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ප්‍රතිඵල ඉටුකරවා ගැනීම සඳහා කාර්ය මණ්ඩලයේ එක් එක් නිලධාරියා වෙත නිශ්චිත වගකීම් පැවරිය යුතු වුවත් රබර් පර්යේෂණ ආයතනයේ නිලධාරීන් සඳහා විධිමත් පරිදි කාර්ය පැවරුම් (Duty List) ලබා දීමට කටයුතු කර නොතිබුණි . | කාර්ය පැවරුම් බොහෝමයක් දෙපාර්තමේන්තු අංශ ඒකක සඳහා ලබා දී ඇති අතර ලබා දී නොමැති දෙපාර්තමේන්තුවලට වහාම කාර්ය පැවරුම් ලබා දී ආයතනය තුල අභ්‍යන්තර පාලන ක්‍රමය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | කාර්ය මණ්ඩලයේ එක් එක් නිලධාරියා වෙත වෙන වෙනම කාර්ය පැවරුම් (Duty List) ලබා දිය යුතුය. |

### 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා බැංකුව අඟලවත්ත ශාඛාවේ පවත්වාගෙන යන රු.3,000,000ක ස්ථාවර තැන්පතුව සඳහා ආයතනයේ නම භාවිතා නොකර වතු අධිකාරි නමින් පවත්වාගෙන ගොස් තිබුණි. | ඩාර්ටන්ෆීල්ඩ් වතු යායේ ස්ථාවර තැන්පතු ගිණුමේ නම අධ්‍යක්ෂ ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය නමින් වෙනස් කිරීමට තැන්පතුව දීර්ඝ කිරීමේදී කටයුතු කරනු ඇත. | ස්ථාවර තැන්පතු ආයතනය නමින් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.70,609,994ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,367,158ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.76,977,152ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් වියදම් 15,122,498 කින් හා ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් රු.43,880,177කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය | ඉකුත් වර්ෂය සමඟ වෙනස් වීම | වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| --------- | ---------------- | -------------- | --------------- | ------------- |
| | රු. | රු. | රු. | සියයට |
| රජයේ ප්‍රදාන | 512,367,455 | 394,650,000 | 117,717,455 | 30 |
| වෙනත් ආදායම් | 47,534,038 | 21,242,083 | 26,291,955 | 124 |
| විලම්භිත ආදායම් | - | 174,271,891 | (174,271,891) | 100 |
| වතු ආදායම් | 117,584,111 | 133,143,628 | (15,559,517) | 12 |
| වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ | 354,446,535 | 394,187,004 | 39,740,469 | 10 |
| සැපයුම් හා පරිභෝජන වියදම් | 41,862,017 | 29,029,011 | (12,833,006) | 44 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 163,536,107 | 119,655,930 | (43,880,177) | 37 |
| වෙනත් වියදම් | 131,018,063 | 115,895,565 | (15,122,498) | 13 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 5:1ක් හා 4:1ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එම අගයන් පිළිවෙලින් 5:1ක් හා 5:1ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රබර් පර්යේෂණ මණ්ඩලය විසින් සිදුකරනු ලබන පර්යේෂණවල සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් ප්‍රධාන පර්යේෂණ ලේඛනයක් මණ්ඩලය විසින් නඩත්තු කර නොතිබුණි. | රබර් පර්යේෂණායතනය විසින් සිදු කරනු ලබන සියලු පර්යේෂණවල සවිස්තරාත්මක තොරතුරු ප්‍රතිඵල, පර්යේෂණ පත්‍රිකා, ඇගයීම්, පේටන්ට් බලපත්‍ර ආදී සියලු විස්තර වාර්ෂික සමාලෝචනය තුල සම්පින්ඩනය වන අතර එය රබර් පර්යේෂණායතනයේ වාර්ෂික | රබර් පර්යේෂණ මණ්ඩලය විසින් සිදු කරන ප්‍රධාන පර්යේෂණ ඇතුළත් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රකාශනයක් වන බැවින් රබර් පර්යේෂණ මණ්ඩලයේ ද පර්යේෂණ සමාලෝචන ලෙස භාවිතා කර ඇත. | |
| (ආ) | රබර් කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන් සහ ආයතන විසින් රබර් කර්මාන්තය ආශ්‍රිතව ඉදිරිපත් වන පැමිණිලි සම්බන්ධව විධිමත් ලේඛණයක් මණ්ඩලය විසින් නඩත්තු කර නොතිබුණු බැවින් පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | මෙතෙක් එම පැමිණිලි සටහන් අදාල දෙපාර්තමේන්තු විසින් වෙන වෙනම පවත්වාගන යනු ලැබූ අතර මේ පිළිබඳ සංක්ෂිප්ත වාර්තා ගොනුවක් අදාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් යටතේ පවත්වා ගැනීමට කටයුතු කරනු ඇත. | පැමිණිලි සම්බන්ධ ලේඛණයක් පවත්වා ගෙන යා යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පැවති රු.5,285,109,496ක ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කර නොතිබුණි. | ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛනය මේ වන විට සකස් කරමින් පවතින අතර සම්පූර්ණ කල වහාම විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ස්ථාවර වත්කම් ලේඛණයක් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (ඈ) | රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය හරහා ව්‍යාපාරික ආකෘතියක් ලෙස රබර් නිෂ්පාදන සැලසුම් කිරීම සහ කාර්යසාධනය ඇගයීම සඳහා රු.මිලියන 49.7ක් වැය කර ආරම්භ කර තිබුණු අංශුමාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානයේ (FEAS CENTER) කාර්යයන් 2023 ඔක්තෝම්බර් මාසයේ සිට සම්පූර්ණයෙන්ම නවත්වා තිබුණු බැවින් අදාල ගොඩනැගිල්ල හා රු.38,918,694ක් පිරිවැය වූ පරිගණක හා මෘදුකාංග, යන්ත්‍ර, ලිබඩු හා කාර්යාල උපකරණ සියල්ල නිශ්කාර්යව පැවතිණි. ඒ අනුව එම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ අරමුණු වූ ගෝලීය වෙළඳපල තුළ ඵලදායී ලෙස තරඟ කිරීමට ශ්‍රී ලංකාවේ ස්වභාවික හා කෘතීම රබර්වලට අගය එකතුකිරීම සඳහා, රබර් නිෂ්පාදනවල නිර්මාණය හා අනුකරණ (simulation) සඳහා FEAS භාවිතා කිරීමට අවශ්‍ය | මෙම අංශුමාත්‍ර පරිමිත සේවා කරන මධ්‍යස්ථානයේ සම්පූර්ණ මෙහෙයුම් කටයුතු ප්ලාස්ටික් හා රබර් ආයතනය වෙත රබර් පර්යේෂණ මණ්ඩලය හා එම ආයතනය අතර 2018.08.23 ඇති කර ගත් අවබෝධතා ගිවිසුමක් මගින් පවරා දෙනු ලැබිනි. එතැන් සිට 2023 ඔක්තෝම්බර් තෙක් ප්ලාස්ටික් හා රබර් ආයතනය රබර් කටයුතු මෙහෙයුම් කල අතර 2023 ඔක්තෝම්බර් මස මෘදුකාංග වල ඇති වූ ගැටළුවක් මත එහි කාර්යන් ඇන හිටි ඇති අතර එම මෘදුකාංග සැපයුම් කරුවන් වෙත ඒ බව දැන්වීමෙන් පසු 2024 ජනවාරි මස සිට එය යථා තත්වයට පත් කෙරිණි. එහෙත් ප්ලාස්ටික් හා රබර් ආයතනය 2024.08.10 දින සිට මෙම මධ්‍යස්ථානයේ පරිපාලනයෙන් බැහැර වන බව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරිම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය රබර් | රාජ්‍ය හා පෞද්ගලික හවුල්කරුවන් අතර ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව ආයතනයේ කාර්යයන් නිසි අධ්‍යනයකින් යුතුව විධිමත් ලෙස සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කුසලතා සංවර්ධනය සහ කළාපයට FEAS සේවා සැපයීමේ විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානයක් බවට පත්වීම යන අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | පර්යේෂණ මණ්ඩල සාමාජිකයන් ප්ලාස්ටික් රබර් ආයතනයේ මහතුන් සහ මෙම යෝජනාව ඉදිරිපත් කල ශ්‍රී ලංකා රබර් සහ රබර් භාණ්ඩ නිෂ්පාදන හා අපනයන කරුවන්ගේ නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් රැස් විය. ඒ අනුව මෙම මධ්‍යස්ථානය නැවත සක්‍රිය කිරීමක් සඳහා එකාබද්ධ යෝජනාවක් ලෙස විවෘත (Expression of Interest) අභිලාශ ප්‍රකාශ කිරීමේ ආරාධනා නිකුත් කරමින් වෙනත් වෘත්තීය ආයතනයක් සමඟ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යොජනා කර ඇත. එම යොජනාව අමාත්‍යාංශය සමඟ සාකච්චා කොට රබර් පර්යේෂණ මණ්ඩල අනුමැතිය සහිතව ක්‍රියාත්මක කිරිමට කටයුතු කරනු ඇත. | |
| (ඉ) | රබර් කිරි ප්‍රවාහනය සඳහා සුදුසු මහෙන්ද්‍රා වර්ගයේ කැබ් රථයක් ආයතනය සතුව පැවතුණද එම වාහනය භාවිතා නොකර 2021 වර්ෂයේ සිට අදාල කාර්යය වෙනුවෙන් කුලී වාහනයක් භාවිතා කර තිබුණු අතර 2023 වර්ෂයේදි එම වාහනය වෙනුවෙන් රු1,825,520ක වියදමක් මණ්ඩලය විසින් දරා තිබුණි. එසේම ආයතනය සතු කැබ් රථය 2023 වර්ෂයේදි ධාවනය නොකර හා ර ථය අලුත්වැඩියා කටයුතු සඳහාද යොමු නොකර වර්ෂය පුරාම අවභාවිතව පැවතුණි. 2024 වර්ෂයේදිද රබර් කිරි ප්‍රවාහනය මෙම කුලී වාහනයෙන්ම සිදුකරමින් පවතී. | අංක LC–6743 දරන කැබ් රථයේ නඩත්තු වියදම් අධික බැවින් කුලී පදනම මත ලබා ගත් වාහනයක් භාවිතා කිරීම ලාභදායී බව තාක්ෂණ ඇගයීම් කමිටුව වාර්තා කර තිබූ හෙයින් 2023 දෙසැම්බර් 31 දක්වා ඒ අනුව රබර් කිරි ප්‍රවාහනය කරන ලදී. එසේ වුවත් විගණන විමසුමේ පෙන්වා දී ඇති කරුණු පාදක කොට ගෙන පිරිවැය විශ්ලේෂණ වාර්තාවක් ප්‍රවාහන නිළධාරීගෙන් කැඳවා ඇත. එම වාර්තාව ලැබෙන තෙක් කිරි ප්‍රවාහන කොන්ත්‍රාත්තුව මාස 2 කින් දීර්ඝ කර ඇත. වාර්තාවේ කරුණු පදනම් කොට ගෙන ඉදිරියේදී ආයතනයේ වාහනය භාවිතා කිරීමට හෝ කුලී පදනම මත වාහනයක් භාවිතා කිරීමට පියවර ගනු ඇත. | රබර් පර්යේෂණ මණ්ඩලයේ කාර්යයන් සඳහා ආයතනයේ වාහන ඵලදායී ලෙස යොදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2024 ජූලි 03 දින වන විටත් මොනරාගල කුමාරවත්ත හා අලව්ව නාරම්පොලවත්ත වතුයායන් රබර් පර්යේෂණ මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. | මොනරාගල කුමාරවත්ත හා අලව්ව නාරම්පොලවත්ත යන වතු පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | ඉඩම්වල පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019-2020 කාලපරිච්ඡේදයේදි ඇරඹී තිබුණු පත්‍රපතන රෝගයට අදාල වසංගත විද්‍යාත්මක අධ්‍යයන සහ ව්‍යාධිජනකයන්ගේ ජීව විද්‍යාත්මක අධ්‍යයන සිදු කිරීම සහ කාර්යක්ෂම රෝග කළමනාකරණ ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා රබර් පර්යේෂණ ආයතනය විසින් 2021, 2022 හා 2023 වර්ෂයන්හි පිළිවෙලින් රු.10,000,000ක්, රු.8,000,000ක් හා රු.13,740,000ක් යොදවා තිබුණද 2023 වර්ෂය අවසානයට හෙක්ටයාර් 11,482.59ක පත්‍ර පතන රෝගය ව්‍යාප්ත වී තිබුණි. | ලැබී ඇති සියලු ප්‍රතිපාදන අදාල ව්‍යාපෘති සඳහා භාවිතා කිරිමට කටයුතු කර ඇත. | පත්‍ර පතන රෝගයේ මර්ධනය සඳහා ලැබූ මුදල් ඵලදායී ලෙස යොදා ගෙන රෝග ව්‍යාප්තිය පාලනය කිරීමට නොපමාව පියවර ගත යුතුය. |
| (ආ) | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමඟ 2017 වර්ෂයේදී ගිවිසුම්ගතව 2022 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණු කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ජීව ඉන්ධන දැව වර්ග හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතියෙහි කාර්යයන් සාර්ථකව නිම නොකිරීම හේතුවෙන් ඒ සඳහා ලැබී තිබුණු රු.10,457,200ක මුදලින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් රු.4,283,644ක් එනම් සියයට 40ක මුදලක් ඉතිරිව තිබුණි. | මෙම ව්‍යාපෘතියේ ගෙවීමට නියමිත ශේෂය සම්බන්ධව දැනට අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් පවතින බැවින් එම කටයුතුවලින් පසු ලබා දෙනු ලබන නිර්දේශ මත ඉදිරි කටයුතු කිරීමට පියවර ගනු ඇත. | ගිවිසුම්ගත කාර්යයන් අදාල කාලය තුලදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව ශාක ව්‍යාධි විද්‍යා හා ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය යටතේ කුඩා පරිමාණ ගෘහ කර්මාන්ත දිරිගැන්වීම වෙනුවෙන් ජාතික එකතුව පවත්වා ගෙන යාම | කුඩා පරිමාණ ගෘහ කර්මාන්තය සඳහා වැදගත් ක්ෂුද්‍රජීවී විශේෂ 30ක් පමණක් හඳුනාගෙන තිබුණද, 30ක් තෝරාගැනීම සඳහා රෝපිත 150ක් පමණ අධ්‍යයනය | සැලසුම් කරන ලද ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා ක්ෂුද්‍ර ජීවි විශේෂ (Cultures) 100ක් හඳුනාගැනීමට සැලසුම්කර තිබුණද Cultures 30ක් පමණක් හඳුනාගෙන වෙන්කර තිබුණු රු.520,000කින් රු.420,000ක් එනම් සියයට 80ක් වියදම්කර තිබුණි. | කිරීමට සිදුවී ඇත. | |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව මණ්ඩලයේ උපදේශන සේවා දෙපාර්තමේන්තුව විසින් වතු අංශය සඳහා ආකෘති නිශ්කාශන (Model clearings) 02ක් ස්ථාපිත කිරීමට, වැසි ආරක්ෂක නිදර්ශන බිම් 02ක් ස්ථාපිත කිරීමට හා අතුරු බෝග නිදර්ශන බිම් 02ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණද 2023 වර්ෂයේදි එම කාර්යයන් සිදුකර නොතිබුණි. | **ආකෘති නිශ්කාශන ස්ථාපිත කිරීම -**<br>වතු අංශයේ ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා නව ව්‍යාපාතියක් ලෙස 2023 දී හඳුන්වා දෙන ලදි. මෙම ව්‍යාපෘතියට කැමැත්ත පල කල වතු සමාගම් අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට මැලිකමක් දැක් වූ නිසා මෙහි ප්‍රගතිය අවම වීමද සිදු විය. 2024 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමට වතු සමාගම්වල ඉහල කළමණාකාරිත්වය සමග නැවතත් සාකච්ඡා කරනු ඇත.<br>**වැසි අරක්ෂක නිදර්ශන බිම් ස්ථාපිත කිරීම -**<br>පසුගිය වසරේ වැසි ආවරණ සවිකිරීම සඳහා අවශ්‍ය වන අමු ද්‍රව්‍ය මිල ඉහල යාමත් සමඟ වතු සමාගම් නව වැසි ආවරණ සවිකිරීම සඳහා මැලිකමක් දැක්වීම ප්‍රගතිය අවම වීමට හේතු වී ඇත.<br>**අතුරු බෝග නිදර්ශන බිම් ස්ථාපිත කිරීම -**<br>සමස්ථයක් වශයෙන් වතු අංශයෙන් නව වගා ඉඩම් ප්‍රමාණය අඩු වීම මෙම ප්‍රගතිය පහළ වැටීමට හේතු විය. | සැලසුම් කරන ලද ඉලක්කයන් අදාල කාලය තුලදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ටයර් මධ්‍යස්ථානයට අයත් 2020 වර්ෂයේදී ස්ථාපනය කර තිබුණු රු.20,034,200ක Gas Chromatography-Mass Spectrometry (GC-MS) උපකරණය සහ රු.15,950,000ක ICP-OES උපකරණය පසුගිය වර්ෂවලදී අවස්ථා කිහිපයකදී පමණක් සාම්පල් පරීක්ෂා කිරීම සඳහා භාවිතා කර තිබුණු බැවින් හා උපකරණ මෙහෙයවන පර්යේෂණ නිලධාරීන් ආයතනයෙන් ඉවත් වීම හේතුවෙන් එම උපකරණ ඌන උපයෝජිතව පැවතිණි. ඒ අනුව මෙම උපකරණ 02 මිලදී ගැනීමෙන් අපේක්ෂා කළ අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණු අතර මිලදී ගැනීමට යෙදවූ රු.35,984,200ක මුදලින්ද ප්‍රමාණවත් උපයෝජනයක් සිදුවී නොතිබුණි. | මෙම උපකරණ දෙක මිලදී ගැනිමේ අරමුණ වන්නේ රබර් හා රබර් භාණ්ඩ වල ඇති සංයුතිය (බැර ලෝහ අයන හා බහු ඇරෝමිතික සංයෝග ආදිය) පිලිබඳ පරීක්ෂා කිරීම දේශිය හා අන්තර් වෙලඳපොලට අවශ්‍ය උසස් තත්වයෙන් යුතු රබර් භාණ්ඩ නිෂ්පාදනය කිරිමේදි අවශ්‍ය වන පර්යේෂණ හා සේවා සැපයිම වේ. මෙම සේවා සැපයීමේදි ඒ සඳහා වැය වන අවම ගාස්තු අයකර ගනිමින් ශ්‍රී ලංකා කර්මාන්ත කරුවන්ට මෙම සේවාවන් සැපයීම සඳහා විදේශ රටවලට යැවිමේදි දැරිමට සිදු වන අධික වියදමත් කල්ගත වීමත් වැලැක්විමද මෙම උපකරණ මිලදි ගැනිමේ අරමුණකි. එම නිසා මිලදී ගැනිමේ පරමාර්ථය වන්නේ ආදායම් ජනනය කිරිමක් නොවන අතර පර්යේෂණ සේවා සැපයීමකි. කෙසේ වෙතත් 2021 හා 2022 යන කාල වලදි පැවති අනපේක්ෂිත ගෝලීය හා දේශීය අස්ථාවරත්වය සහ මෙම උපකරණය මෙහෙයවනු ලබන පර්යේෂන නිලධාරින් ආයතනයෙන් ඉවත් විම නිසා මෙම යන්ත්‍ර ඌන උපයේජිතව පැවතීම හා එකඟ වන අතර ආයතනයේ පවතින ප්‍රතිපාදන මත එම තත්වයෙන් මිදි එම උපයෝගිතාවය වර්ධනය කර ගැනිමට පියවර ගනු ඇත. | මිලදී ගත් උපකරණ සැලසුම් කළ පරිදි උපරිම ඵලදායිතාවයෙන් යුතුව භාවිතයට ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 04කට වැඩි කාලයක සිට ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර පුරප්පාඩුව පැවති අතර අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති කණිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරි හා සාමාන්‍ය වැඩකරු තනතුරු සඳහා 26 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුර පිරවීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබූ විගස පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත.<br>වතු දෙපාර්තමේන්තුවට සේවයේ අවශ්‍යතාවය මත චෙක්රෝල් සේවකයින් බඳවා ගන්නා අතර, ඒ සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීමක් සිදු නොවේ. එසේම මෙවැනි සේවකයින්ගේ වැටුප් ගෙවීම සඳහා උපයා ගන්නා මුදල් භාවිතා කර ඇත. එසේ වුවත් ආයතනයේ අවශ්‍යතාවය සඳහා වතු දෙපාර්තමේන්තුව මගින් ලබා ගන්නා සේවකයින්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත. | විධිමත් අනුමැතීන් මත පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (ආ) | රබර් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ සඳහා ඍජුව කටයුතු කරනු ලබන දෙපාර්තමේන්තු 12න් දෙපාර්තමේන්තු 05ක ප්‍රධානී තනතුරු මාස 04 සිට වසර 33ක් දක්වා පුරප්පාඩු වී තිබුණු අතර ඒ සඳහා වැඩබැලීමේ නිලධාරීන් පත් කර තිබුණි. | මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2024.02.28 දින පැවැති දෙවන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත යොමු කර ඇත. මේ සඳහා විධිමත් අනුමැතියක් ලැබෙන තුරු දෛනික කටයුතු කර ගෙන යාම සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත් කර ඇත. | මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් කඩිනම් කළ යුතුය. |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ආයතනයේ ප්‍රධාන රාජකාරි සඳහා දෛනික වැටුප් ලබන සේවකයින් බඳවා ගෙන තිබුණු අතර සේවකයින් 32ක් මාස 02 සිට වසර 22 දක්වා මණ්ඩලයේ සේවයේ යෙදී තිබුණි. | සේවයේ අවශ්‍යතාවය මත වතු දෙපාර්තමේන්තුවට චෙක්රෝල් සේවකයින් බඳවා ගන්නා අතර, ඔවුන්ගේ සියලු කටයුතු වතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර, අවශ්‍යතාවයකදී පමණක් වතු දෙපාර්තමේන්තුවෙන් සේවකයින් ආයතනයට ලබා ගෙන ඇත. | විධිමත් අනුමැතීන් මත පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කුරුවිට උප මධ්‍යස්ථානය සඳහා අනුමත කාර්යමණ්ඩලයේ නොමැති තනතුරක් වන ව්‍යාපෘති නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හෝ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පමණක් පුවත්පත් දැන්වීමක් පල කර තිබුණු අතර ඒ සඳහා රු.47,092ක වියදමක් දරා තිබුණි. | National Natural Rubber Productivity ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 70,000 සිට 100,000 දක්වා වැඩි කිරීම සඳහා කුරුවිට උප මධ්‍යස්ථානය විධිමත් වතු කළමනාකරණ උපාය මාර්ග යටතේ පවත්වා ගෙන යාමට වතු කළමනාකරණ කමිටුවේදී තීරණය විය. මේ යටතේ සේවය කළ කුරුවිට වතු කළමනාකරු විශ්‍රාම ගැනීමෙන් පසුව 2017 හා 2018 වර්ෂ වල මේ සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවුවද සුදුසුකම් සහිත නිළධාරීන් අයදුම් කර නොතිබුණි. එසේම, දැනට වතු කළමනාකරුවකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී නොමැති නිසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත තාවකාලික පදනමින් ව්‍යාපෘති නිළධාරියෙකු බඳවා ගැනීමට කටයුතු යොදා තිබිණි. මේ සඳහා අනුමැතිය ලබා ගැනීමට මේ වන විටත් අමාත්‍යාංශයට යොමු කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |